# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2124/41 - 2019 මැයි මස 24 වැනි සිකුරාදා - 2019.05.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

ඇමුණුම් - 01

### ඌව පළාතේ පළාත් සභාව

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(1) වගන්තිය යටතේ ඌව පළාත් ආණ්ඩුකාරවර ජනාධිපති නීතීඥ මාර්ෂල් පෙරේරා වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පහත සඳහන් පත්කිරීම් සිදු කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ නිලධාරී එම්. බී. ආර්. එම්. එස්. ජී. බී. රත්නායක මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි (2019.01.24 වැනි දින සිට) ඌව පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ බදුල්ල නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ වශයෙන්,

2. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී ඩබ්. එම්. එම්. ජී. අබේසිංහ බණ්ඩා මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි (2019.02.13 වැනි දින සිට) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) වශයෙන්,

3. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරිණී ජී. ඩබ්. සී. එස්. ප්‍රියභාෂිණී මහත්මිය, 2019.02.18 වැනි දින සිට තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අතිරේකව, බදුල්ල මහා නගර සභාවේ නාගරික කොමසාරිස් තනතුරේ රාජකාරී ඉටුකිරීමට,

4. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිණී ආර්. ඒ. එච්. ඒ. සමරසිංහ මහත්මිය, වහාම ක්‍රියාත්මක වන පරිදි (2019.02.26 වැනි දින සිට) තම නිත්‍ය තනතුරේ රාජකාරී කටයුතුවලට අතිරේකව ඌව පළාත් සභාවේ ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික සහ පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කරන තෙක් හෝ විශ්‍රාම යන දිනය තෙක් එම තනතුරේ වැඩ බැලීමට.

5. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ II ශ්‍රේණියේ නිලධාරි එච්. කේ. පී. ජයලත් මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි (2019.05.08 වැනි දින සිට) ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඌව පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ වශයෙන්,

**ජනාධිපති නීතීඥ මාර්ෂල් පෙරේරා,**
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2019 මැයි මස 21 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී,
බදුල්ල.

06-171

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.